*සැ. යු.* - 2021.09.03 වැනි දින පළ කරන ලද අංක 2244 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,245 - 2021 සැප්තැම්බර් මස 10 වැනි සිකුරාදා - 2021.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 178 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

177 - B 82267 - 353 (2021/09)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, උයන්වත්තේ ජයසිංහ මුදියන්සේලාගේ සම්පත් සුමන බණ්ඩාර ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 සැප්තැම්බර් තිස් වන දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/1019 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පට්ටියකැලේ ජනපදයේ පදිංචි මීරා හුසේන් අබ්දුල් මජීඩ් වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/G/146/1151 යටතේ 1984.10.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගංඟහය උතුර කෝරළයේ තැන්නේකුඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තැන්නේකුඹුර නමැති ගමේ පිහිටා ඇති, සර්වේයර් ජනරාල්වරයා විසින් සාදනු ලැබ, මහනුවර මැනුම් අධිකාරී භාරයේ ඇති 1 25/22 ක්ෂේත්‍ර පත්‍රයෙහි පි. පි. මහ407 දරන පිඹුරෙහි අංක 45 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් පර්චස් 30ක් විශාලත්වය ඇත්තාවූ ද පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

ඉඩම : පට්ටියකැලේ ජනපදය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 44, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 35 දරන ප්‍රවේශ මාර්ගය හා 60 දරන ඇළ රක්ෂිතය, |
| *දකුණට* | : | කැබලි අංක 46 හා 60 දරන ඇල රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 48 දරන පාර රක්ෂිතය හා කැබලි අංක 46. |

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළය.

2020 දෙසැම්බර් මස 20 වැනි දින.

09-94/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වගුරේ ගමරාළලාගේ යමුනා ප්‍රියදර්ශනී දයාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.09.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/807 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන .................. පදිංචි හේනයලාගේ ගෙදර ලමාරිදී වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. සී. 8/104 යටතේ 1984.01.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩපළාත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කදුකර පහළ පත්තුවේ/කෝරළේ මෙගොඩ කළුගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හල්ඔය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 2117 දරන රේඛා සටහනේ අංක 21 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්. 0 රූඩ් 03, පර්. 21 වූ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : හල්ඔය ජනපදය

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජනපද පාර සහ කට්ටි අංක 20, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක 07 |
| *දකුණට* | : | කට්ටි අංක 07, |
| *බස්නාහිරට* | : | හි. පි. 66714. |

ඩබ්. ජී. වයි. පී. දයාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දෙළුව.

2021 අප්‍රේල් මස 03 වැනි දින.

09-94/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කපිල ගද්දිල ලැනරෝල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1992.07.20 වැනි දින ප්‍රදනය කර ඇති අංක මධ්‍යම/ගඉකෝ/125 දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන ඇත්ගාල ජනපදයේ පදිංචි මිරිස්සේ රතුබඳුගේ විල්බට් වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක සී. 8/62 යටතේ 2009.06.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.10.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨායේ ගඟඉහළ කෝරළේ සිංහපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තැඹිලිගල පල්ලේගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, අංක මු. පි. මහ 2364 දරන රේඛා සටහනේ අංක 32 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.094/ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ඇත්ගාල ජනපදය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 31, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 33, |
| *දකුණට* | : | කැබලි අංක 41, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 41 හා 77. |

කේ. ජී. ලැනරෝල්,
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ කුරුදුවත්ත නව නගරය.

2020 සැප්තැම්බර් මස 21 වැනි දින.

09-94/3